ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
உள்நாட்டு தொழிற்பாடுகள் திணைக்களம்
Domestic Operations Department

2020 ජුලි 24

මෙහෙයුම් උපදෙස් අංක : 35/03/023/0001/003

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත

**"කොන්ත්‍රාත්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය මත පදනම්ව ඉදිකිරීම් අංශය සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම" සඳහා වන මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම**

1. ඉදිකිරීම්, ඖෂධ සහ අනෙකුත් හඳුනාගත් අංශවල රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය මත පදනම්ව "ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම" යටතේ සපයනු ලබන ණය පහසුකමින් ආවරණය වන පරාසය ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පුළුල් කරන ලද බව මෙමගින් දැනුම් දෙනු ලැබේ.

2. ඒ අනුව, 2020 ජුලි 03 වැනි දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අංක 35/03/023/0001/002 හි සඳහන් ඉදිකිරීම් ක්ෂේත්‍රය සඳහා වන ද්‍රවශීලතා පහසුකම "රජයේ කොන්ත්‍රාත්කරුවන්ගේ සහ සැපයුම්කරුවන්ගේ නොපියවූ බිල්පත් ගෙවීමට අදාළව රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රතිග්‍රාහක ලිපිය මත පදනම්ව ඉදිකිරීම්, ඖෂධ අංශ සහ අනෙකුත් හඳුනාගත් අංශවල රජයේ කොන්ත්‍රාත්කරුවන් සහ සැපයුම්කරුවන් සඳහා සපයනු ලබන ද්‍රවශීලතා පහසුකම" නමින් නම් කරනු ලැබේ.

3. ඉහත සඳහන් කළ සංශෝධනයන්ට අනුව මෙහෙයුම් උපදෙස් අංක 35/03/023/0001/002 හි අඩංගු විධිවිධාන සහ ආකෘති පත්‍ර, ඉදිකිරීම්, ඖෂධ අංශ සහ අනෙකුත් හඳුනාගත් අංශවල රජයේ කොන්ත්‍රාත්කරුවන්ට සහ සැපයුම්කරුවන්ට අදාළ ණය පහසුකම සඳහා නිකුත් කළ මෙහෙයුම් උපදෙස්වලට අදාළ වේ.

4. මෙම පහසුකම යටතේ සඳහන් "අනෙකුත් හඳුනාගත් අංශ", අවශ්‍යතාව මත මුදල් මණ්ඩලය විසින් විටින් විට තීරණය කරනු ලබන අතර, එවැනි තීරණ අවශ්‍ය පරිදි දැනුම් දෙනු ලැබේ.

අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

7 වන මහල, 2 වන කුළුණ
අංක 30, ජනාධිපති මාවත
තැ.පෙ. 590, කොළඹ 01, ශ්‍රී ලංකාව

தளம் 7, கோபுரம் 2
இல. 30, சனாதிபதி மாவத்தை
த.பெ 590, கொழும்பு 01, இலங்கை

Level 7, Tower 2
No. 30, Janadhipathi Mawata
P.O. Box 590, Colombo 01, Sri Lanka

+94 112 477036 | +94 112 346287 | ddod@cbsl.lk | www.cbsl.gov.lk